

# සම්‍යක් වංචාව

පච, ටොම් පච, බොරු, අමූලික බොරු අතරේ සම්‍යක් බොරු කියා වර්ගයක් ද ඇත. මේ සම්‍යක් බොරු යන්නෙන් අදහස් කෙරෙන්නේ කිසිවෙකුට පාඩුවක් හෝ අවැඩක් හෝ සිදු නොවන ආකාරයේ බොරු යැයි කියවේ. එනම්, සම්‍යක් බොරුවක් නොකියා සිටීම නිසා මෙන්ම එවැන්නක් නොකියා සත්‍යය ම පමණක් පැවසුවහොත් බොහෝ විට සිදුවන්නේ අවැඩකි, අයහපතකි.

උදාහරණයක් ලෙස, පසුගිය රාජ්‍ය භීෂණ සමයේ ලංකාවේ කුප්‍රකට වූ සුදු වෑන් රථයකින් පැහැර ගෙන යන විට ඉන් මිදී පලා යන පුවත්පත් කලාවේදියෙකු ඔබේ නිවසේ සැඟවුණා යැයි සිතන්න. ඔහු ලුහු බැඳ එන විරු මැර පිරිස එවැන්නෙකු දුටුවේදැයි ඔබෙන් ඇසූ විට ඔබ සත්‍යය පැවසුවොත් සිදු වෙන්නේ අවැඩකි. එනිසා, ඔබ බොරුවක් කියන්නට පෙළඹෙනු ඇත.

එය සම්‍යක් බොරුවක් ලෙස හැඳින්වෙන්නේ, එමගින් කිසිවෙකුට යහපතක් මිස අවැඩක් පාඩුවක් කිරීමේ චේතනාවක් ඔබ සිත තුළ නැති හෙයිනි. එසේ ම, ඒ ආකාරයට සම්‍යක් බොරුවක් නොකියා, ඔබ සත්‍යය පමණක් ම පැවසුවහොත් සිදුවෙනු ඇත්තේ මහා විපතකි. සම්‍යක් බොරුව යන්න සඳහා සුදුසුම ඉංගිරිසි පදය වයිට් ලයි බව සැලකිය හැකිය.
ජනපද කල්‍යාණිය හා විවාහ වී ශාක්‍ය දේශයේ රජකම ගන්නට සැරසී සිටි තම ඥාති සොහොයුරු නන්ද කුමාරයාට සුරූපී සුරඟනක් ලබා දෙන බව කියා රවටා තම ශාසනයේ මහණ කර ගත් බුදුන් එද කළේ ද සම්‍යක් ප්‍රයෝගයක් බව බණ කතන්දරවල කියවේ. එයින් හැඟෙන්නේ, අප මහා සම්මා සම්බුදු රජාණන් පවා සම්‍යක් බොරු දෙසාබා, බොරු පොරොන්දු දී ඇති බවයි.
මේ ආකාරයෙන් ම අපට සම්‍යක් වංචාව යනුවෙන් යෙදුමක් ද අර්ථ දක්වා ගත හැකි යැයි සිතමි. වංචාවක් යනු අයථා ආකාරයෙන් මූල්‍යමය වාසියක් ලබා ගැනීමයි. එනිසා, සම්‍යක් වංචාවක් යන්නෙන් අදහස් කෙරෙනු ඇත්තේ කිසිවෙකුට හොඳක් මිස නොහොඳක් නොවෙන ආකාරයෙන් සිදු කෙරෙන වංචාවකි.

මා මේ සැරසෙන්නේ මා ද සහභාගී වූ එවැනි සම්‍යක් වංචාවක් ගැන ඔබට කියන්නටයි.
මා කලක් සේවය කළ රජයේ සංස්ථාවකට මා ද ඇතුළුව ඉංජිනේරු උපාධිධාරීන් අට දෙනෙකු ම එක්වර බඳවා ගනු ලැබුණි. අප සේවය ඇරඹුවේ ඒ වසරේ පෙබරවාරි මුල සතියේ ය.
ඉංජිනේරු වෘත්තියේ මූලික ශ්‍රේණියේ පිහිටුවා තිබූ මේ රැකියාවේ දී අපේ මූලික වැටුප රුපියල් දෙදහස් දෙසිය පනහක් විය. මසක් තුළ කිසිදු නිවාඩුවක් නොගෙන සේවයට පැමිණියහොත් ප්‍රසාද දීමනාවක් ලෙස සැමට සමානව රුපියල් දෙසීයක් ලැබුණි. දින භාගයක නිවාඩුවකට රුපියල් පනහ බැගින් එය අඩුවෙයි. සංස්ථාවේ නිෂ්පාදන පරිමාව අදාළ නිර්ණායක පැන්නූ මාසවල දී ඒ සඳහා මාසික වැටුපෙන් ප්‍රතිශතයක්, රුපියල් 850 ක උපරිමයකට යටත්ව, පාරිතෝෂික දීමනාවක් ලෙස ගෙවන ලදී.
මීට අමතරව, අප පසුව දැනගත් පරිදි වසර අවසානයේ ද පාරිතෝෂික දීමනාවක් ලැබුණි. එය බොහෝ විට මසක වැටුපකට සමාන විය.
මේ වර්ෂ 1987 ආරම්භයයි. පාන් ගෙඩියක මිල රුපියල් පහක් පමණ විය. රජයේ සේවකයින් ලෙස සලකන විට එද අපට හොඳ පඩියක් ලැබුණු බව මට සිතේ.




අප කණ්ඩායම සේවය අරඹා මුල් සති කිහිපය ගෙවී ගියේ ආයතනයේ එක් එක් අංශ පිළිබඳව අදාළ කළමනාකරුවන් ගේ දේශන සහ කර්මාන්ත ශාලා අංශ නැරඹීම මගින් අධ්‍යයනය කිරීමටයි. අප එක් එක් ඉංජිනේරුවා ආයතනයේ දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කෙරුණේ ඉන් පසුව ය.

මේ මුල් කාලයේ දී ආයතනයේ පිරිස් කළමනාකරණ දෙපාර්තමේන්තුව නමින් එද අප හැඳින්වූ අද භාෂාවෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව වී ඇති අංශයේ එක්තරා නිලධාරියෙකුගෙන් අපට ලැබුණේ අපූරු ආරංචියකි. එනම්, ආයතනයේ සේවකයින්ට වාර්ෂිකව චාරිකාවක් යැම සඳහා රුපියල් එකසිය පනහක දීමනාවක් ලබා දෙන බවත්, එය අපට ද හිමි බවත් ය.

ඊට පසු වර්ෂ කිහිපයේ දී අප ද හොඳින් කාරණා දැන වැඩකටයුතු සලසාගත් පරිදි, ආයතනයේ සෑම සේවකයෙකු ම පාහේ වසරේ මුල ජනවාරි මාසයේ දී ම මේ දීමනාව ලබා ගනිති. ඒ සඳහා කළ යුතු වෙන්නේ බොහෝ විට තමා සේවය කරන දෙපාර්තමේන්තුවේ සහෝදර සේවක පිරිස හා එක්වී තමන් චාරිකාවක් යෑමට අදහසක් කරන බව පවසා, අදාළ දීමනාව ලබා දෙන ලෙස ඉල්ලමින් ලිපියක් පිරිස් කළමනාකරණ අංශය වෙත යොමු කිරීමයි.

වෙනත් රාජකාරි අතරේ මේ විෂයය සම්බන්ධයෙන් ද කටයුතු කිරීම සඳහා අනුයුක්ත කොට සිටි ඉහත නිලධාරියාගෙන් අපට දැනගන්නට ලැබුණේ එද මාර්තු මාසය වෙන විට මුළු ආයතනයෙන් ම මේ දීමනාව ලබා ගෙන නැත්තේ පෙබරවාරියේ දී සේවය ඇරඹූ අප අට දෙනා පමණක් බවත්, අප කළ යුත්තේ ද ඉහත ආකාරයේ ලිපියක් ලියා ඔහුට ලබා දීම බවත් ය. එසේ නොකර සිටීමට සුවිශේෂී හේතුවක් නොමැති වීම නිසා අප ද කළේ ඒ ආකාරයේ ලිපියක් යොමු කිරීමයි. අලුතෙන් බැඳුණු අප පිරිස ගාලු මුවදොර පිටියට චාරිකාවක් යන බව එහි ලා සඳහන් කළෙමු.
ඒ ලිපියේ ප්‍රතිඵලයක් ලෙස අපේ මාර්තු මාසයේ වැටුපට රුපියල් එකසිය පනහ බැගින් එකතු වී තිබුණි.

සම්‍යක් වංචාවක් මිස නොම්බර එකේ හොර වැඩක් කිරීමට අපේ කිසිදු අදහසක් නොමැති වූ බැවින් අප ඊළඟට කළේ ඊළඟ සිකුරාද ම අපේ ගාලු මුවදොර චාරිකාව යොදා ගැනීමයි.
චාරිකාවේ ගමන් පිරිවැය වූයේ සේවා ස්ථානයේ සිට කොළඹ කොටුව දක්වා බස් ගාස්තුව වූ රුපියල් කිහිපයක් පමණකි. කලින් දිනයක මිලට ගත් තේ කහට වතුර බෝතල්, සෝඩා සහ කොකා කෝලා බෝතල් සඳහා ද, ගාලු මුවදොර පිටිය අසල දී මිලට ගත් කඩල, රටකජු සහ බැඳපු කුකුළා සඳහා ද වියදම් කළ පසු අප අත ඒ චාරිකා දීමනාවෙන් අඩකටත් වඩා ඉතිරි වූ බව සත්‍යයකි. එයින් කියවුණේ අපේ ආර්ථික කළමනාකරණයේ තිබූ ඉහළ කාර්යක්ෂමතාවය මිස අන් කිසිවක් නොවේ.

ඒ සමගම කිවයුතු වැදගත් කරුණක් වෙන්නේ, මේ රැකියාව ඇරඹීමට පෙර සිටම එකිනෙකා හඳුනන කීප දෙනෙකු ම අපේ කණ්ඩායමේ අට දෙනා අතර සිටියද, එක කණ්ඩායමක් ලෙස තරමක හෝ එකමුතුවක් මේ චාරිකාව නිසා අප අතර ඇති වූ බවයි.

ආයතනයට අලුතෙන් සේවයට බැඳුණු අප කණ්ඩායමට අපේ පත්වීමේ ලිපියේ හෝ එවැනි තැනක සඳහන් නොවූ මේ දීමනාව ගැන කරුණු කියා දුන් පෙර කී නිලධාරියා ගැන අපට ඇති වුණේ ප්‍රසාදයක් බව අමුතුවෙන් කිව යුතු නැත.
නමුත්, චාරිකාවෙන් සතියකට පමණ පසු අපට දැන ගන්නට ලැබුණේ මේ දීමනාව ලබා ගැනීම සඳහා අපට ඔත්තුව ලබා දුන් පෙර කී නිලධාරියා අප ඔහුව මේ චාරිකාවට එකතු කර නොගැනීම ගැන තරමක දුකෙන් පසු වෙන බවයි.
අපට ඒ දුක්මුසු ආරංචිය ගෙනා පුද්ගලයා ගේ උපදෙස ද අනුව අප ඊළඟට කළේ තවත් චාරිකාවක නිරත වීමයි.

මේ දෙවෙනි චාරිකාව සිදුවූනේ අපේ ආයතනයේ සිට හයිලෙවල් පාරේ නුගේගොඩ මංසන්ධිය අසල පිහිටි ඩොමිනියන් වැනි නමකින් හැඳින්වුණු පූජනීය සිද්ධස්ථානයකටයි. ඒ සඳහා අපේ සත්ගුණවත් නිලධාරියා ද විශේෂ අමුත්තා වශයෙන් සහභාගි විය.

මුල් චාරිකාවේ දී මෙන්ම බස් ගාස්තුව අවමයක් වූ නමුත්, රටකජු, කඩල වෙනුවට ඩෙවල් බීෆ් වැනි දේ පූජා වට්ටියට එකතු වීම නිසා, චාරිකා දීමනාවෙන් ඉතුරු වූ මුදල් සියල්ලම පාහේ අපට මේ දෙවන චාරිකාවේ බරපැන සඳහා දැරීමට සිදුවිය.

---

5 වන පිටෙන්

කොමිසමේ සමුළුවේදී 2012 පෙබරවාරි මාසයේදී කතාවක් කරමින් කියනවා උගත්පාඩම් කොමිසමේ වාර්තාවට අනුව කටයුතු කරනවා කියලා. පරීක්ෂණ සඳහා රට තුළ හමුදා අධිකරණයක් පිහිටුවා තිබෙන බව කිව්වා. පරීක්ෂණත් නැහැ. අධිකරණත් නැහැ. ප්‍රකාශයක් කරලා ආවා විතරයි. මේ හැමදේම එකතු කරලා තමයි මානව හිමිකම් කොමිසම ලංකාවට එරෙහිව තීන්දු ගන්නේ.

එතනින් නොනැවතී ආණ්ඩුව 2012 ජූලි 28 වෙනිදා උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී සැලැස්මක් හදලා ඇමැති මණ්ඩලය විසින් අනුමත කරගත්තා. ඒ කාලේ මානව හිමිකම් කොමසාරිස් නවනීදන් පිල්ලේ ආණ්ඩුව විසින් ගෙන්වා ගත්තා. ඇය ලංකාව පිළිබඳව සොයා බලා පුවත්පත් සාකච්ඡාවක් කළා. ලංකාව පරීක්ෂණයක් නොකරන තරමට ජාත්‍යන්තර පරීක්ෂණයක් එනවා කියලා ඇය අනතුරු ඇඟෙව්වා. ඒ අනුව තමයි ජාත්‍යන්තර පරීක්ෂණයක් එන්නේ. එදා පත්කළ ජාත්‍යන්තර පරීක්ෂණ කමිටුවේ වාර්තාව තමයි 2015 අගෝස්තු මාසයේදී එළිදක්වලා තිබෙන්නේ.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලේ උදලාගම කොමිසම, මැක්ස්වෙල් පරණගම කොමිසම වගේ කොමිසන් කිහිපයක් පත්කළා ලංකාව තුළ සිදුවූ සිදුවීම් කිහිපයක් ගැන සොයන්න. ඒ කොමිසන්වලට විදේශ නියෝජිතයින් ගෙන්වා ගත්තා.

එක්සත් ජනපදය ගෙනා යෝජනාව පිළිගත්ත එක මේ ආණ්ඩුව කළ මෝඩ වැඩක්. එය පිළිගන්න අගය කරන්න ඕන යෝජනා මාලාවක් නොවේ. ඒ යෝජනාව රස තවරලා විෂ එවලා තියෙන්නේ. එක්සත් ජනපදය යෝජනාවක් ගේන තෙක් ලංකාවේ ආණ්ඩුව මොකද කළේ. අපි ලෑස්තියි මානව හිමිකම් ආරක්ෂා කරන්න, ජනතාවගේ ප්‍රශ්න විසඳන්න කියලා ආණ්ඩුව අලුතෙන් යෝජනාවක් දැම්මා නම් ඒක රටටත් ජනතාවටත් ගෞරවයක්. එක්සත් ජනපදය කිව්වාම රනිල් කියනවා සත්‍ය විමර්ශන කොමිසමක් පත්කරනවා කියලා. නමුත් ජනතා විමුක්ති පෙරමුණ කියන විට ඒක කරන්න බැහැ. දැන් සත්‍ය විමර්ශන කොමිසම පත්කළාම ගෞරවය යන්නේ එක්සත් ජනපදයටයි. දෙමළ ජනතාවත් කල්පනා කරනවා එක්සත් ජනපදය නිසයි ප්‍රශ්නය විසඳුණේ කියලා. ඒ නිසා වර්තමාන ආණ්ඩුවත් හැසිරෙන්නේ අඳබාල හැඩේකටයි. එක්සත් ජනපදනයත් සමග යාළු වුණාම හැමදේම හරියනවා කියලා මේ නායකයෝ හිතාගෙන ඉන්නවා. එක්සත් ජනපදයට දේශපාලනයක් තිබෙනවා; උපායමාර්ගයක් තිබෙනවා; ඔවුන්ට යාළුවෝ නැහැ. ඔවුන් වැඩකරන්නේ තමන්ගේ වුවමනාවට අනුවයි.

2017 මාර්තුවල මානව හිමිකම් කොමිසමේ 34වැනි සැසිවාරය පැවැත්වීමට නියමිතයි. එහිදී මේ යෝජනාවට අනුව වැඩකරලා ලංකාව ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයි. දැන් බැඳිලා ඉන්නේ. මේ යෝජනාවල නරක දේවල් තිබෙනවා. ලංකාවේ නෛතික ක්‍රියාවලියකට විදේශ කණ්ඩායමක් සම්බන්ධ කරගැනීම පිළිබඳව අපිට ප්‍රශ්නයක් තිබෙනවා. එන්නේ තාක්ෂණික සහය දීමට කියලා තිබෙනවා. නමුත් රිංගුවට පස්සේ ආපසු එළවන්න බැහැ. ලංකාවේ ජනතාවගේ මානව හිමිකම් කඩවීම් පිළිබඳව රට තුළ පරීක්ෂණයක් කරන්න ආණ්ඩුවට බැරිනම් මොකටද එහෙම ආණ්ඩු. මේ ප්‍රශ්නය වර්තමානයේදීත් තිබෙන්නේ අතීතයේ තිබුණ තැනමයි. නැවතත් ජාත්‍යන්තරයට පාර කපා තිබෙනවා. මේ අනතුරෙන් ගැලවෙන්න දැනුත් අවස්ථාවක් තිබෙනවා. මේ ප්‍රශ්නයට ජනතාව සමග එකතුවෙලා උත්තර සෙවිය යුතුයි. ඒ සඳහා මේ රටේ ජනතාව එකට ඉන්න ඕනෑ.

ජිනීවා උගුලෙන් ගැලවෙනවානම් උත්තරයක් තිබෙනවා. අධිරාජ්‍යවාදීන්ගේ උපායමාර්ග හඳුනාගෙන එය වැළැක්විය යුතුයි. රට තුළ මානව හිමිකම් රැකිය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළ යුතුයි. ඒ වගේම මානව හිමිකම් කඩවීම පිළිබඳව රටතුළ නිවැරදි, පිළිගත හැකි, විනිවිද පරීක්ෂණයක් සිදුකළ යුතුයි. ඒක කරන්න අපිට හැකියාව තිබෙනවා. එවැනි පරීක්ෂණයක් අපේ රටේ අධිකරණයට, නීතිපති දෙපාර්තමේන්තුවට කරන්න පුළුවන් කියලා ජාත්‍යන්තරයට ඔප්පු කර පෙන්වන්න ඕනෑ. නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණය දේශපාලනයට අනුව නොව නීතියට අනුව වැඩ කළ යුතුයි. අගතියට පත්වූ අයට යුක්තිය ඉටුවිය යුතුයි. වැරදිකරපු අයට දඬුවම් දීමෙන් පමණක් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ වගකීම ආණ්ඩුවට තිබෙනවා. දැන්වත් ආණ්ඩුව උතුරේ ජනතාවගේ ප්‍රශ්න විසඳිය යුතුව තිබෙනවා.